පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 492

நிறுவனத்தின் பெயர்: மாவட்ட செயலகம் - குருணாகல்

பாராளுமன்ற அரசாங்கக் கணக்குகள் குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகள் மற்றும் எடுக்கப்பட வேண்டிய நடவடிக்கைகளை பாராளுமன்றத்திற்குச் சமர்ப்பித்தல்.

**Parliamentary Series No: 492**

**District Secretariat Office Kurunegala**

**Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)**

ආකෘති (අංක.01)

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119(4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු මාලා අංක : 492

ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල

| රාජ්‍ය ගිණුම් කාරක සභාව මඟින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මඟපෙන්වීම් | අදාළ අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගණන් දීමේ නිලධාරීන් විසින් ගත් ක්‍රියා මාර්ග / වර්තමාන ප්‍රගතිය |
|---|---|
| වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි. | **52-5707 උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ් රථය**<br>මෙම කැබ් රථය වාහන අපහරණ චක්‍රලේඛය පරිදි තක්සේරු කමිටුවක් මඟින් තක්සේරු කොට අපහරණය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස 2025.11.25 දිනැතිව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද ලිපියට 2026.03.16 දිනැතිව සිහිකැඳවීම් ලිපියක් ද යවා ඇතත්, මේ දක්වා පිළිතුරු ලැබී නොමැති බැවින් එම අනුමැතිය ලද පසු විධිමත් පරිදි අපහරණ කටයුතු කරන බව දන්වා සිටිමි.<br><br>**52-6128 ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යලයේ කැබ් රථය**<br>තාක්ෂණික කමිටුවක් මඟින් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට නිර්දේශ කරන ලද ඉහත වාහනය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය අනුව 2026.04.06 දින අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇති අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාවිතා කරනු ලබයි. |
| මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | සාමාන්‍ය පරිදි වර්ෂයක මූලාරම්භයේ දී මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නියමිත දින පිළිබඳව සැලසුම් කිරීම හා එම දිනයන් ලබා දීම සම්බන්ධීකරණ කමිටු සම සභාපතිවරුන්ගේ උපදෙස් අනුව පහත සඳහන් පරිදි සිදු කරන ලදී. |

| මාසය | අපේක්ෂිත දිනය |
|---|---|
| ජනවාරි | 10 |
| පෙබරවාරි | 03 |
| මාර්තු | 03 |
| අප්‍රේල් | 07 |
| මැයි | 04 |
| ජූනි | 02 |

| | |
|---|---|
| ජූලි | 11 |
| අගෝස්තු | 04 |
| සැප්තැම්බර් | 12 |
| ඔක්තෝබර් | 10 |
| නොවැම්බර් | 14 |
| දෙසැම්බර් | 12 |

ඒ අනුව 2023 වර්ෂය සඳහා සැළසුම් කළ පරිදි සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සිදු නොවූ අතර, නියමිත **දින 12 න්,** මාර්තු මස 03 වන දින ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් විශේෂ රැස්වීමක්ද ඇතුළුව **දින 07ක්** කමිටු රැස්වීම් පවත්වා ඇති බවත් සම්බන්ධීකරණ කමිටු සම සභාපතිවරුන් විසින් පාර්ලිමේන්තු සැසි පැවැත්වෙන දින පදනම් කර ගනිමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් සඳහා දින ලබා දෙන බැවින් එසේ ලබාදෙන සෑම දිනයකදීම කමිටු රැස්වීම පැවැත්වීමට කටයුතු කර ඇති බවත් දන්වා සිටිමි. එසේ රැස්වීම් පැවැත්වූ දිනයන් අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා පහත පරිදි දක්වා ඇත.

| මාසය | පැවැත්වූ දිනය |
|---|---|
| මාර්තු | 03 |
| මාර්තු | 30 |
| මැයි | 17 |
| ජූනි | 28 |
| ජූලි | 26 |
| සැප්තැම්බර් | 26 |
| දෙසැම්බර් | 27 |

ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය , යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.

### 1.6.1. මූල්‍ය නොවන වත්කම්

**(අ)**

කුලියාපිටිය(නැගෙනහිර), උඩුබද්දාව, මල්ලවපිටිය, රස්නායකපුර හා ගල්ගමුව යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 ස්ථාපිත කර වර්ෂ 16 සිට 60ක පමණ කාලයක් ඉක්මවා ගොස් ඇතත් එම කාර්යාල පිහිටි ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණ අතර එම ඉඩම් වල වටිනාකම තක්සේරු කර දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

| ප්‍රා.ලේ.කාර්යාලය | විස්තරය |
|---|---|
| කුලි/නැගෙනහිර | ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ඇත. ඉඩම් අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීමෙන් පසු "දෙපාර්තමේන්තු නිදහස් කිරීම" සිදු කරනු ලැබේ. ඒ අනුව මෙම ඉඩම නිදහස් කිරීමට අදාල ලේඛන පලාත් ඉඩම් කොමසාරිස් මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත 2024.06.12 දිනැතිව යොමු කර ඇත. කාර්යාලය පිහිටි ඉඩමෙහි වටිනාකම තක්සේරු කර 2024 ජුනි මස ගිණුම් සාරාංශයට ඇතුලත් කර ගිණුම්ගත කරන ලදී. |
| උඩුබද්දාව | කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2026-02-03 දිනැතිව මෙම ඉඩම රජයේ ඉඩමක් සේ සලකා කටයුතු කරන ලෙස දන්වා එවා ඇත. ඒ අනුව, මෙම ඉඩම පවරා ගැනීමේ ඉදිරි කටයුතු සඳහා ඉඩම පවරා දීමට ඉල්ලීම් ලිපියක් එවීමට කටයුතු කරන ලෙස දන්වා 2026-04-17 දිනැතිව ප්‍රාදේශීය ලේකම් විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇත. |
| මල්ලවපිටිය | ඉඩමේ වටිනාකම තක්සේරු කර දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර ඇත.සිගාස් වැඩසටහන සඳහා ද ඇතුලත් කර ඇත. |
| රස්නායකපුර | 2025-01-28 දිනැතිව මෙම ඉඩම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත පවරා ගිණුම්ගත කර ඇත. |
| ගල්ගමුව | මෙම ඉඩම 2016 වර්ෂයේදී රු. 11,750,000.00 ට තක්සේරු කර CIGAS වැඩ සටහනට ඇතුලත්කර ගිණුම් ගත කර ඇත. |

**(ආ).**

2022 වර්ෂයේ ගම සමඟ පිළිසඳර ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 කට අදාළව ඉදිකරන ලද සේවා පියස ගොඩනැගිලි 16 ක් සඳහා වැයකරන ලද රු.6,590,261 ක වටිනාකම ස්ථාවර වත්කම් වශයෙන් හඳුනාගෙන නොතිබුණි.

2022 වර්ෂයේ ගම සමඟ පිළිසඳර ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 කට අදාලව විගණනයෙන් පෙන්වා දී ඇති ඉදි කරන ලද සේවා පියස ගොඩනැගිලි 16 ක් සඳහා වැය කරන ලද මුදල් සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.

| ප්‍රා.ලේ. කාර්යාලය | ග්‍රාම නිලධාරී වසම | විගණනයෙන් පෙන්වා දී ඇති වටිනාකම | සත්‍ය වියදම | විස්තරය |
|---|---|---|---|---|
| පන්නල | මත්තේගම | 346,290.00 | 339,500.00 | සේවා පියස ගොඩනැගිලි 05 ක් ඉදිකිරීම සඳහා වන සත්‍ය මුදල රු.2,279,500.00 ක මුදලක් ස්ථාවර වත්කම් ලෙස මේ වන විට ගිණුම්ගත කර ඇත. |
| | නාරංගොඩ උතුර | 494,700.00 | 485,000.00 | |
| | මූකලාන | 197,877.00 | 194,000.00 | |
| | හොරවඩුන්න | 692,580.00 | 679,000.00 | |
| | පරගම්මන | 593,640.00 | 582,000.00 | |
| ඉබ්බාගමුව | උඩතම්මිට | 236,170.00 | 230,170.00 | ගම සමඟ පිළිසඳරක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ 2022 වර්ෂයේ දී රු 230,170.00 මුදලින් සිදු කර ඇති උඩතම්මිට ග්‍රාම ලේකම් කාර්යාලයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, උඩතම්මිට ග්‍රාම ලේකම් කාර්යාල යටතේ ප්‍රග්ධනිත කර නොතිබුණු අතර 2024 මැයි මස ගිණුම් සාරාංශය මඟින් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර ඇත. |
| නිකවැරටිය | දණ්ඩුවාව | 372,300.00 | 372,300.00 | සේවා පියස ගොඩනැගිල්ලෙහි සංවර්ධන කටයුතු සිදු කිරීමකි. 2024 ජූලි මස ගිණුම් සාරාංශයෙන් ගිණුම්ගත කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | තරණගොල්ල | 1,188,000.00 | 1,188,000.00 | මෙම වසම් වලට අදාල සේවා පියස ගොඩනැගිලි 2024 ජුනි මස ස්ථාවර වත්කම් ලෙස හදුනාගෙන මාසික ගිණුම් සාරාංශයට ඇතුලත් කර ඇත. |
| | නිකවැරටිය දකුණ | 346,800.00 | 346,800.00 | |
| | දලුක්ගොල්ල | 493,677.00 | 493,677.00 | |
| | පින්නපොලේගම | 594,000.00 | 594,000.00 | |
| | කිරිදිගල්ල | 273,360.00 | 273,360.00 | |
| මහව | කරඹේ | 253,305.00 | 253,305.00 | මෙම සේවා පියස ඉදිකිරීම වෙනුවෙන් වැය කරන ලද මුදල් මැයි මස ගිණුම් සාරාංශයෙන් ස්ථාවර වත්කම් වශයෙන් ගිණුම් ගත කර ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර ඇත. |
| | කඩම්බාව | 263,288.00 | 263,288.00 | |
| වාරියපොල | කහගොල්ල | 1,188,000.00 | 1,188,000.00 | ගමසමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ ග්‍රාම නිලධාරී කාර්යාලයේ අත්‍යාවශ්‍ය පහසුකම් සපයා කාර්යාලය සංවර්ධනය කිරීම (විදුලිය , සනීපාරක්ෂක පහසුකම් ) යටතේ 2022.03.31 දින පළමු කොටස් ගෙවීම ලෙස රු.746,975.50 ක් හා 2022.08.31 දින අවසන් ගෙවීම ලෙස රු.417,024.50ක් ගෙවීම් සිදු කර ඇත.ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා ගෙවීම් අනුමත මුදල වන රු.1,164,000.000ක් මුදලක් මෙම ව්‍යාපෘතිය සඳහා ගෙවීම් සිදුකර ඇති අතර එම වටිනාකම 2023 මැයි මස CIGAS වැඩසටහනට ඇතුළත් කර ඇත. ඒ අනුව විගණන විමසුමේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ගෙවන පරිපාලන වියදම වන 2% |

| | | | | |
|---|---|---|---|---|
| | | | | මුදල වන රු.24,000.00 ද සහිතව මෙම ව්‍යාපෘතිය වැය වූ මුළු මුදල ලෙස රු.1,188,000.00 ලෙස සඳහන් කර ඇත. |
| | තෙන්නකෝන්ගම | 243,086.00 | 219,085.00 | ගම සමඟ පිළිසඳරක් වැඩසටහනේ පොදු යටිතල පහසුකම් සංවර්ධනය යටතේ 1284- තෙන්නකෝන්ගම වසමේ සේවා පියස ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුදල වශයෙන් රු.1,164,000.00ක් යෝජනා වී තිබුණි.එහි පළමු ගෙවීම ලෙස 2022.03.31 දින රු.219,085.76 ක මුදලක් පමණක් ගෙවා පළමු අදියරේ වැඩ අවසන් කර ඇත.මෙහි දෙවන ගෙවීම සඳහා ප්‍රතිපාදන ලබාදීමේ හැකියාවක් නොමැති බැවින් ඉතිරි කොටස නිම කර නොමැත. ගෙවීම් සිදුකරන ලද රු.219,085.76 ක මුදල 2023 මැයි මස CIGAS වැඩසටහනට ඇතුළත් කර ඇත. |

**1.6.2 නොසැසඳීම්**

2023 දෙසැම්බර් 31 දිනට විෂයයන් 06කට අදාළව රු.819,568 ක බැඳීම් හා බැරකම් භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව පෙන්වා තිබුණද, දෙපාර්තමේන්තු පොත් අනුව බැරකම් පිළිබඳ ප්‍රකාශයේ එවැනි ශේෂයක් දක්වා නොතිබුණි.

SA - 80 ආකෘතිය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ සාරාංශ වාර්තාවක් වන අතර එම තොරතුරුම මූල්‍ය ප්‍රකාශනවලට අමුණා ඇති SA- 82 ආකෘතියෙහිද දැක්වෙන බැවින් SA-80 ආකෘතිය මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කර නොමැති බව දන්වමි.

| | |
|---|---|
| **1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.<br>ස්ථාවර වත්කම් ලේඛනය<br>විදුලි උපකරණ පිළිබඳ ලේඛනය<br>බැරකම් පිළිබඳ ලේඛනය<br>උප පත්‍රිකා පොත් ලේඛනය<br>ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | (see table below) |
| දිස්ත්‍රික් ඉඩම්පරිහරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස් වී නොතිබුණි. | 2023 වර්ෂයේදී 2023.06.16 හා 2023.08.15 දිනයන්හි කමිටු දෙකක් පවත්වා ඇති අතර එම වර්ෂයේ මුල් කාර්තුව සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු නිර්දේශ ඉල්ලා ඉදිපත් වූ ඉල්ලීම් ප්‍රමාණය අවම වීම හේතුවෙන් කමිටුව රැස්වී නොමැත. විශේෂයෙන් කොරෝනා වසංගතයෙන් අනතුරුව නිශ්චිත ලෙස ප්‍රාදේශීය මට්ටමෙන් ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු නොපවත්වා තිබීම මත දිස්ත්‍රික් කමිටුව වෙත ඉල්ලීම් නොලැබීම හේතුවෙන් 2023 වර්ෂයේ කමිටු දෙකක් සඳහා පමණක් ප්‍රතිපාදන වෙන් කර ඇත. |

| ලේඛන වර්ගය | වර්තමාන තත්ත්වය |
|---|---|
| **(i)** ස්ථාවර වත්කම් ලේඛනය | විගණනයෙන් පෙන්වා දී ඇති සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල ස්ථාවර වත්කම් සියල්ල ලේඛනයට ඇතුලත් කර එම ලේඛනය යාවත්කාලීන කර ඇති අතර CIGAS වැඩසටහන සමග සසදා තුලනය කර ඇත. |
| **(ii)** විදුලි උපකරණ ලේඛනය | විගණනයෙන් පෙන්වා දී ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල විදුලි උපකරණ ලේඛනය පවත්වාගෙන යනු ලබයි. |
| **(iii)** බැරකම් ලේඛනය | කුලි/නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂයේ සිට බැරකම් ලේඛනයක් ආරම්භ කර නඩත්තු කරනු ලබයි. |
| **(iv)** උප පත්‍රිකා පොත් ලේඛනය | කුලි/නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විගණනයෙන් පෙන්වා දුන් පරිදි අඩුපාඩු නිවැරදි කර නිසි පරිදි නඩත්තු කරනු ලබයි. |
| **(v)** ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටු පැමිණීමේ ලේඛනය | කුලි/නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විගණනයෙන් පෙන්වා දුන් පරිදි 2024 වර්ෂයේ සිට ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණ ඇගයීම් කමිටු පැමිණීමේ ලේඛනයක් පවත්වාගෙන යන අතර බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන කමිටු පැමිණීමේ ලේඛනය 2023 වර්ෂයේ ආරම්භයේ සිට පවත්වාගෙන යනු ලබන අතර තාක්ෂණ ඇගයීම් කමිටු පැමිණීමේ ලේඛනය 2024 වර්ෂයේ ආරම්භයේ සිට පවත්වාගෙන යනු ලබයි. |

| | |
|---|---|
| | එසේම ඒවන විට සිටි සහකාර අධ්‍යක්ෂ(දි.ඉ.ප.) විශ්‍රාම ලබා ඉවත්ව යාමත් නැවත කොන්ත්‍රාත් පදනම මත සේවයට බැඳීමක් සිදුවී ඇති අතර අමාත්‍යාංශ ලේකම් මගින් එම සේවය අනුමැතියට යොමුකර තිබූ කාලය තුල නෛතිකව කමිටුව රැස්කිරීමට ලේකම් ලෙස නොහැකිවීමද මෙසේ කමිටු දෙකක් පැවැත්වීමට හේතු සාධක වී ඇත.<br><br>2023 වර්ෂයේ කමිටු දෙකකට සීමා වුවද 2024 , 2025 යන වර්ෂ වලදී නියමිත පරිදි කාර්තුවකට එක් කමිටුවක් වශයෙන් පවත්වා ඇති අතර මේවන විට නියමිත පරිදි කමිටු පැවැත්වීමෙ කටයුතු සිදුකර ඇති බව දන්වමි. |
| උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ නියමයන්ට අනුව එකම සේවා ස්ථානයේ වර්ෂ 05 කට වැඩි කාලයක් සේවය කර ඇති නිලධාරීන් හට ස්ථාන මාරු ලබා දීම සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වමි.<br>I. වසර 05 ට වැඩි සේවා කාලයක් සහිත ග්‍රාම නිලධාරීන් හා ආර්ථික සංවර්ධන නිලධාරීන් වසම් අතර මාරු කිරීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දී ඇති අතර, ඒ අනුව පසුගිය වසර කිහිපය තුල අභ්‍යන්තර මාරු ක්‍රමවේදය යටතේ නිලධාරීන් ස්ථාන මාරු කර ඇත.<br>II. දිස්ත්‍රික්කයෙන් පිටත හා දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු ඉල්ලුම් කළ ස්ථාන මාරු අයදුම්පත් අදාළ ස්ථානමාරු බලධාරීන් වෙත යොමුකර ඇත. (ඒ සම්බන්ධව බලතල දි.ලේ. වෙත නොපවතින බැවින්)<br>III. දිස්ත්‍රික්කය තුල ස්ථානමාරු ලබාදිය යුතු නිලධාරීන් වෙනුවෙන් දිස්ත්‍රික් ස්ථානමාරු මණ්ඩල සෑම වර්ෂයකම ක්‍රියාත්මක කිරීම තුළින් නිලධාරීන්ගේ ඉල්ලීම්ද සැලකිල්ලට ගනිමින් අදාළ ස්ථාන මාරු නියෝග නිකුත් කර ඇත.<br>IV. වාර්ෂික නොවන ස්ථානමාරු යටතේ නිලධාරී ඉල්ලීම් අනුව ස්ථානමාරු ලබා දීමට කටයුතු කර ඇත.<br><br>02. තවද පහත සඳහන් කරුණු හේතුවෙන් වසර 05 ට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් යම් ප්‍රමාණයක් තවදුරටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතුව සිටින බවද සඳහන් කරමි.<br><br>I. විශේෂ පුහුණුවීම් ලබා ඇති නිලධාරීන් මෙන්ම විශේෂ වැඩසටහන්/ රාජකාරී පැවරී ඇති නිලධාරීන්ද ස්ථාන මාරු කිරීමෙන් මතුවන රාජකාරීමය දුෂ්කරතා වලක්වා ගැනීමේ අරමුණින් සේවා අවශ්‍යතා මත.<br>II. දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුප්‍රාප්තිකයන් ලබා දීමේ ගැටළුව හා විශාල වශයෙන් පුරප්පාඩු පවතින කාර්යාලවල සිටින සීමිත නිලධාරීන් ස්ථාන මාරු කිරීමෙන් මතුවන පරිපාලනමය දුෂ්කරතා වලක්වා ගැනීම සඳහා. |

| | |
|---|---|
| | III. සෑම වර්ෂයකම වසර 05 ට වැඩි නිලධාරීන් ප්‍රමාණය නැවත නැවත අළුත් වීමෙන් අදාළ සංඛ්‍යාත්මක අගයන්ගේ අඩුවීමක් පෙන්නුම් නොකිරීම. (නමුත් එම සංඛ්‍යාවෙහි ඇතුළත් වන්නේ පෙර වර්ෂයේ වසර 05 ට වැඩි නිලධාරීන් කණ්ඩායම ම නොවන බව)<br>IV. ඇතැම් නිලධාරීන් මාරු කිරීමේ බලතල දිස්ත්‍රික් ලේකම් වෙත නොවීම.(දෙපාර්තමේන්තු ගත නිලධාරීන් වැනි)<br>කෙසේ වෙතත් පෙර වර්ෂවලට සාපේක්ෂව මේ වන විට වසර 05 ඉක්මවූ නිලධාරීන් විශාල ප්‍රමාණයක් ස්ථාන මාරු කර ඇති අතර, කාර්යාල වල සාමාන්‍ය රාජකාරි කටයුතු වලට බාධා නොවන පරිදි ඉතිරි නිලධාරීන්ට ද අදියරෙන් අදියර ඉදිරියේදී ස්ථාන මාරු ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව ද වැඩිදුරටත් දන්වමි. |

ප්‍රධාන ගණකාධිකාරි ,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

කුරුණෑගල.

පී.ඩබ්.එස්.කේ. විජේසිංහ
ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
කුරුණෑගල.

දිස්ත්‍රික් ලේකම්,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

කුරුණෑගල.

ඩී.එම්.කේ.සී. දිසානායක
දිසාපති/දිස්ත්‍රික් ලේකම්
කුරුණෑගල.

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළගා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරශ්‍රය - කොළඹ 07.